

ජාතික අයවැය දෙපාර්තමේන්තුව


මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය

ජාතික අයවැය 2027

පුරවැසි අයවැය

වාර්ෂික අයවැයෙහි ජනතා හිතවාදී අනුවාදයක්

නොවැම්බර් 2026


2027
පුරවැසි
අයවැය යනු
කුමක්ද?




වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148-152 ව්‍යවස්ථාවන් ප්‍රකාරව) ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවයකි. 2027 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලට, 2027 වර්ෂය තුළ එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ආයතනයට අදාළ වැය සීමාවන් සමඟ මෙම වියදම් දැරීම සඳහා මූල්‍ය සම්පාදනය කිරීමේ යෝජිත මාධ්‍යයන් ඇතුළත් වන අතර එය ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ආකෘතිය සාමාන්‍ය ජනතාව හට සංකීර්ණ බවක් පෙන්නුම් කරයි.

එබැවින්, රාජ්‍ය අයවැයේ අන්තර්ගත තොරතුරු වඩාත් සරල හා අඩු පාරිභාෂික බවකින් යුතුව බෙදා හැරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව අදහස් කර ඇත. තවද, වාර්ෂික අයවැයේ ප්‍රධාන කරුණු විනිවිදභාවයකින් යුතුව හා පහසුවෙන් ග්‍රහණය කරගත හැකි පරිදි සාරාංශගත කර මහජන හිතකාමී අනුවාදයක් ලෙස ඉදිරිපත් කළ යුතු බවට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 20 වැනි වගන්තියේ සඳහන් වේ. මෙහිදී, සියලුම පුරවැසියන් සහ බදු ගෙවන්නන් හට, බදු ආදායම් වියදම් කරන ආකාරය සහ සම්පත් ප්‍රශස්ත ආකාරයකින් වෙන් කිරීමේදී රජයේ ප්‍රමුඛතා කවරේදැයි වඩා හොඳින් අවබෝධ කර ගත හැකි වනු ඇති අතර, මෙම ප්‍රවේශය තුළින් සම්පත් වෙන් කිරීම සහ එය කාර්යක්ෂමව උපයෝජනය කිරීම සම්බන්ධයෙන් විනිවිදභාවය සහ වගවීම සහතික කිරීමට මඟ පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වැය දරන ආයතනවල ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම වෙනුවට, මෙම ප්‍රකාශනය මඟින් අංශ අනුව ප්‍රධාන ව්‍යාපෘති / වැඩසටහන් සඳහා රජයේ වියදම් පිළිබඳ තොරතුරු සැකෙවින් සපයනු ලැබේ. තව ද, ණය සේවාකරණය සහ හදිසි සේවා සඳහා වන ප්‍රතිපාදන මෙම අංශ යටතේ නොසැලකේ. පරිශීලනය කිරීමේ පහසුව සඳහා ආංශික එකතුවෙහි රුපියල් අගයන් ආසන්නතම බිලියනයට වටයා ඇති බැවින්, ගිණුම්කරණ ආකෘතියේ සංඛ්‍යා සමඟ සැසඳීමේදී සුළු විෂමතා ඇතිවිය හැකිය.

එසේම, 2027 අයවැය යෝජනා ද ඇතුළත් කරමින් මෙම පුරවැසි අයවැය යාවත්කාලීන කරනු ඇත. මෙම ලේඛනය මෙරට දෘෂ්‍යාබාධිත පුද්ගලයින් හට ප්‍රවේශ විය හැකි පරිදි ඒකකේත (යුනිකෝඩ්) අකුරු වලින් ද ප්‍රකාශයට පත් කර ඇත.

2027 වර්ෂයේදී
රාජ්‍ය ආදායම උපයා ගැනීම සහ එම මුදල් වියදම් කරන ආකාරය





අයවැය 2027

2027 අයවැය සකස් කිරීමේ උපකල්පන

01 2027 වර්ෂයේදී ආර්ථිකය 4%ත් 5%ත් අතර වර්ධනයක් අත් කර ගන්නා බව

02 2027 වර්ෂයේදී දෙවන කාර්තුව වන විට උද්ධමනය ඉලක්ක ගත පරිදි 5% ක මට්ටමක පවත්වා ගැනීම

03 2027 වර්ෂයේදී විරැකියා අනුපාතය 5%ට අඩුවෙන් පවත්වා ගැනීම

04 2027 වර්ෂයේදී රජයේ අයවැය හිඟය මෙරට දළදේ.නි. 4.5%ක මට්ටමින් පවත්වා ගැනීම

05 2027 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් 15.8% ක රජයේ ආදායමක් ලබා ගැනීම

වියදම් ශීර්ෂ අනුව අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම

2027 වර්ෂයේදී කැබිනට් අමාත්‍යාංශ 25 ක්, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන 100ක්, පළාත් සභා 09ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක් සහ විශේෂ වියදම් ඒකක 21ක් සඳහා අයවැය ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදන සලසා ඇත.

සුවපත් සමාජයක් සඳහා නිරෝගී දිවි පෙවෙතක්

සෑම පුරවැසියෙකුටම වඩාත් යහපත් සෞඛ්‍ය සේවාවක්

2027
රු.බි. 710

ප්‍රාග්ධන වියදම
රු.බි.130.8

පුනරාවර්තන වියදම
රු. බි. 578.8

රු.බි. 104.9	රෝහල් සංවර්ධනය
රු.බි. 353.9	රෝහල්වල මෙහෙයුම් කටයුතු
රු.බි. 4.9	දේශීය වෛද්‍ය සේවා
රු.බි. 190.9	වෛද්‍ය සැපයුම්
රු බි. 11.2	ත්‍රිපෝෂ වැඩසටහන ඇතුළු පෝෂණ වැඩසටහන්
රු.බි. 7.6	රෝග නිවාරණ ක්‍රියාකාරකම්
රු.බි. 1.4	සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනය
රු.බි. 28.0	සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය
රු.බි. 6.5	සුවසැරිය ගිලන් රථ සේවාව



2027 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි. 104.9

රෝහල් සංවර්ධනය

රෝහල් ශක්තිමත් කිරීම

ප්‍රාථමික සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම

හදිසි ප්‍රතිකාර හා විශේෂඥ වෛද්‍ය සේවා ශක්තිමත් කිරීම

වඩාත් යහපත් සෞඛ්‍ය සේවාවක් සඳහා රෝහල් ශක්තිමත් කිරීම



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**6.1**	රෝහල් යටිතල පහසුකම් හා පහසුකම් වැඩිදියුණු කිරීම - මහනුවර, කරාපිටිය, අම්පාර, යාපනය, මොණරාගල, ඇඹිලිපිටිය, කලවාන, කුරුණෑගල, මහරගම, මන්නාරම සහ මඩකලපු
රු.බි.	**8.75**	වෛද්‍ය පහසුකම් සහ උපකරණ වැඩිදියුණු කිරීම.
රු.බි.	**18.8**	දිවයින පුරා රෝහල් සඳහා පෙව වෛද්‍ය උපකරණ සහ රසායනාගාර උපකරණ සැපයීම
රු.බි.	**13.79**	දිවයින පුරා සියලුම රෝහල් වාර්ෂිකව ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම.
රු.බි.	**9.4**	එකෝකාඩියෝග්‍රාෆ් (Echocardiograph) යන්ත්‍ර, සී.ටී. ස්කෑනර් යන්ත්‍ර, ඩයලිසිස් යන්ත්‍ර සහ එක්ස්-රේ යන්ත්‍ර වැනි උසස් තාක්ෂණික වෛද්‍ය උපකරණ සැපයීම, සුවසැරිය ගිලන්රථ සේවාව සඳහා ගිලන්රථ 45ක් ලබා දීම
රු.බි..	**4.5**	කුරුණෑගල, අනුරාධපුරය, බදුල්ල, මහනුවර සහ ත්‍රිකුණාමලය යන රෝහල්වල මෙන්ම කොළඹ, පේරාදෙණිය සහ කළුතර පිහිටි වෛද්‍ය රසායනාගාර තාක්ෂණ (MLT) පාසල්වල පහසුකම් වැඩිදියුණු කිරීම.
රු.බි.	**6.74**	කාර්ය මණ්ඩල නිල නිවාස සහ ඖෂධ ගබඩා ප්‍රතිසංස්කරණය කිරීම, ඩිජිටල් රෝගී තොරතුරු පද්ධතිය හා සෞඛ්‍ය මානව සම්පත් දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම සහ පස් අවුරුදු මූලික රෝහල් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.



සෞඛ්‍යමත් ප්‍රජාවක් උදෙසා ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

ප්‍රාදේශීය හා මූලික රෝහල් වැඩිදියුණු කිරීම, ඖෂධ ගබඩා ප්‍රතිසංස්කරණය කිරීම, අත්‍යවශ්‍ය ඖෂධ සැපයීම, රසායනික අපද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ලොරි රථ, ඩබල් කැබ් රථ, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා යතුරු පැදි ලබාදීම සහ වෛද්‍ය සැපයුම් ගබඩා කිරීම සඳහා ශීතකරණ ලබා දීම — **රු.බි.** **16.8**

ආරෝග්‍ය ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර මධ්‍යස්ථාන 1,000ක් ස්ථාපනය කර පවත්වාගෙන යාම — **රු.බි.** **4.6**

හදිසි හා විශේෂඥ වෛද්‍ය සත්කාර සේවා ශක්තිමත් කිරීම – අත්‍යවශ්‍ය හා විශේෂිත ප්‍රතිකාර සඳහා කඩිනම් ප්‍රවේශයක් ලබා දීම



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**1.7**	කොළඹ, මහනුවර සහ අනුරාධපුර රෝහල්වල මාතෘ හා ළමා සත්කාරක පහසුකම් වැඩිදියුණු කිරීම
රු.බි.	**2.6**	තෙලිප්පලෙයි සහ මහනුවර රෝහල්වල පිළිකා ප්‍රතිකාර පහසුකම් වැඩිදියුණු කිරීම සහ පිළිකා රෝගීන් හට උසස් ගුණාත්මකභාවයෙන් යුතු විකිරණ ප්‍රතිකාර ලබාදීමට අවශ්‍ය පහසුකම් සැලසීම
රු.බි.	**2.2**	ජාතික රෝහල, රජ්ජේ ආර්යා ළමා රෝහල, මුල්ලේරියාව සහ රත්නපුර රෝහල්වල හෘද රෝග ප්‍රතිකාර පහසුකම් වැඩිදියුණු කිරීම

රු.බි. 190.9

ඖෂධ වෙත ප්‍රවේශය ඉහළ නැංවීම –රෝගීන්ට අවශ්‍ය ඖෂධ හා ප්‍රතිකාර ප්‍රමාදයකින් තොරව ලබා ගැනීමට පහසුකම් සැලසීම



ප්‍රධාන ක්‍රියාකාරකම්

අත්‍යවශ්‍ය ඖෂධ අඛණ්ඩව ලබාගත හැකි බවට සහතික වීම

වෛද්‍ය සැපයුම් කළමනාකරණය වැඩිදියුණු කිරීම

රු.බි. 7.6



සෞඛ්‍යමත් ජනතාවක් උදෙසා රෝග නිවාරණය හා පාලනය

ප්‍රධාන ක්‍රියාකාරකම්

රෝග නිවාරණ කටයුතු පවත්වා ගෙන යාම	**රු.බි.**	**6.1**
බෝ නොවන රෝග වැළැක්වීම සහ කළමනාකරණය ශක්තිමත් කිරීම	**රු.බි.**	**0.19**
ඒඩ්ස් සහ ක්ෂය රෝගය වැළැක්වීමේ කටයුතු සිදුකිරීම	**රු.බි.**	**0.26**
වසංගත සඳහා සූදානම් වීමේ සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම	**රු.බි.**	**1.33**

රු.බි. 4.9

දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම - රෝගීන්ට අවශ්‍ය ඖෂධ හා ප්‍රතිකාර නියමිත වේලාවට ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**3.0**	දිවයින පුරා දේශීය සෞඛ්‍ය සේවා සැපයීමට අදාළ වැටුප් හා වේතන
රු.බි.	**0.5**	පාරම්පරික වෛද්‍ය නිලධාරීන් සඳහා පුහුණුව ලබා දීම

රු.බි. 11.2



සෞඛ්‍යමත් අනාගත පරපුරක් උදෙසා මව්වරුන් සහ දරුවන් සුරැකීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

ගර්භණී මව්වරුන් සඳහා පෝෂ්‍යදායී ආහාර ද්‍රව්‍ය පැකේජය	**රු.බි.**	**7.2**
ත්‍රිපෝෂ වැඩසටහන	**රු.බි.**	**4.0**

රු.බි. 28.0

ශක්තිමත් සෞඛ්‍ය සේවා ශ්‍රම බලකායක් - වඩාත් ගුණාත්මක රෝගී සත්කාරක සේවාවක් ගොඩනැඟීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**0.95**	අමාත්‍යාංශයේ, අනුරාධපුර ශික්ෂණ රෝහලේ සහ අනුරාධපුර හා කළුතර හෙද පුහුණු පාසල් සඳහා අධ්‍යයන ගොඩනැඟිලි ඉදිකිරීම
රු.බි.	**1.65**	වෛද්‍යවරුන් හට විශේෂඥ උපාධි ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම
රු.බි.	**23.9**	සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පුහුණු කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන

ගුණාත්මක අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම

සෑම දරුවෙකු සඳහා ම ප්‍රශස්ත ඉගෙනුම් අවස්ථා

2027
රු.බි. 749

ප්‍රාග්ධන වියදම
රු.බි. 104.0

පුනරාවර්තන වියදම
රු. බි. 645.4

පාසල් අධ්‍යාපනය	රු.බි. 562.7
විශ්වවිද්‍යාල අධ්‍යාපනය	රු.බි. 148.4
වෘත්තීය අධ්‍යාපනය	රු.බි. 25.7
විද්‍යාව හා තාක්ෂණය	රු.බි. 5.4
දහම් පාසල් අධ්‍යාපනය	රු.බි. 1.3
පූර්ව-ප්‍රාථමික අධ්‍යාපනය	රු.බි. 5.6



2027 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි. 562.7

පාසල් අධ්‍යාපනය

පාසල් සහ ඉගෙනුම් කටයුතු වැඩිදියුණු කිරීම

සෑම දරුවෙකුට ම අධ්‍යාපනයට ඇති ප්‍රවේශය තහවුරු කිරීම

පාසල් හා ඉගෙනුම් කටයුතු වැඩිදියුණු කිරීම – ප්‍රශස්ත ඉගෙනුම් පරිසරයන් සහ වැඩිදියුණු කළ අධ්‍යාපන සේවාවන්

ප්‍රධාන ක්‍රියාකාරකම්		
ජාතික පාසල් 369ක් සහ පළාත් පාසල් 9,656ක් හරහා අධ්‍යාපනය ලබා දීම වෙනුවෙන් පාසල් අධ්‍යාපන කාර්ය මණ්ඩලය සඳහා වන වැටුප් සහ දීමනා	රු.බි.	408.0
පාසල් නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම	රු.බි.	20.0
රජයේ විභාග	රු.බි.	9.60
රජයේ පාසල් 4,250ක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) යටිතල පහසුකම් නැංවීම, පාසල් 2,000ක් සඳහා කේන්ද්‍රගත වෙබ් අඩවි පහසුකම් සැලසීම සහ ග්‍රාමීය පාසල් 1,000ක් සඳහා චන්ද්‍රිකා අන්තර්ජාල සබඳතා ලබා දීම	රු.බි.	4.0
පිරිවෙන් අධ්‍යාපනය	රු.බි.	10.2
ගණිතය සහ ඉංග්‍රීසි භාෂා ඉගෙනුම වැඩිදියුණු කිරීම, වෘත්තීය ගුරු සංවර්ධනය සහ පාසල් සංවර්ධනය	රු.බි.	4.5
පාසල්වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	රු.බි.	3.0
ක්‍රීඩාංගණ, ක්‍රීඩා යටිතල පහසුකම් සහ නේවාසිකාගාර	රු.බි.	0.98
වතු පාසල්වල පහසුකම් සංවර්ධනය	රු.බි.	0.70



සෑම දරුවෙකුට ම අධ්‍යාපනයට ඇති ප්‍රවේශය තහවුරු කිරීම- පවුල්වල අධ්‍යාපනික වියදම් පහත හෙළීම සහ දරුවන් පාසල් අධ්‍යාපනය තුළ රඳවා ගැනීමට සහාය වීම

ප්‍රධාන ක්‍රියාකාරකම්		
රු.බි.	30.0	පාසල් පෝෂණ ආහාර වැඩසටහන
රු.බි.	10.0	පෙළපොත්
රු.බි.	38.2	පාසල් නිලඇඳුම්
රු.බි.	2.5	දුෂ්කර සහ අතිදුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාවහන්
රු.බි.	2.3	සුරක්ෂා රක්ෂණය
රු.බි.	1.9	5 ශ්‍රේණියේ ශිෂ්‍යාධාර
රු.බි.	2.3	ශිෂ්‍යාවන් සඳහා සනීපාරක්ෂක තුවා
රු.බි.	17.3	සිසු සැරිය හා වාර ප්‍රවේශපත්‍ර සහනාධාර
රු.බි.	0.16	ක්‍රීඩා පාසල් සඳහා පෝෂ්‍යදායී ආහාර



පූර්ව-ප්‍රාථමික සහ පූර්ව ළමාවිය අධ්‍යාපනය - සෑම දරුවෙකුට ම ශක්තිමත් පදනමක් ලබා දීම, පාසල් අධ්‍යාපනය වෙත පිවිසෙන දරුවන් වඩා හොඳින් සූදානම් කර තැබීම

රු.බි. 5.6



ප්‍රධාන ක්‍රියාකාරකම්		
පෙර පාසල් ගුරුවරුන් සඳහා ගුරු අභිමානී දීමනාව	රු.බි.	1.19
පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාර වැඩසටහන	රු.බි.	4.4

රු.බි. 148.4

විශ්වවිද්‍යාල අධ්‍යාපනය — උසස් අධ්‍යාපනය සඳහා වැඩි අවස්ථා සහ වැඩිදියුණු කළ විශ්වවිද්‍යාල පහසුකම්



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	76.6	විශ්වවිද්‍යාල 19ක වැටුප් සහ දීමනා
රු.බි.	6.3	පේරාදෙණිය දන්ත වෛද්‍ය පීඨය, වවුනියාව, මොරටුව, සහ අම්පාර හාඩි (Hardy) ආයතනය සහ වෙනත් විශ්වවිද්‍යාලයන්හි නේවාසිකාගාර සහ ආපනශාලා ඇතුළු ශිෂ්‍ය පහසුකම්
රු.බි.	2.0	ඌව වෙල්ලස්ස, රුහුණ, පේරාදෙණිය, රජරට සහ වයඹ යන විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණාගාර සහ පුහුණු පහසුකම් සංවර්ධනය
රු.බි.	13.8	කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතු
රු.බි.	1.6	සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීම
රු.බි.	12.2	සියලු ම විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි පහසුකම් සංවර්ධනය
රු.බි.	3.5	රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ සිසුන් සඳහා වන ණය යෝජනා ක්‍රමය
රු.බි.	7.2	මහපොළ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර
රු.බි.	1.6	මොරටුව සහ ඌව වෙල්ලස්ස වෛද්‍ය පීඨ පිහිටුවීම

රු.බි. 25.7

වෘත්තීය අධ්‍යාපනය — උසස් කුසලතා ගුණාත්මක රැකියා සහ ව්‍යවසායකත්ව අවස්ථා



ප්‍රධාන ක්‍රියාකාරකම්

වෘත්තීය පුහුණු ආයතනවල පහසුකම් සංවර්ධනය කිරීම	රු.බි.	3.5
වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 50ක් වැඩිදියුණු කිරීම	රු.බි.	2.8
නිපුණතා සිසුදිරිය ශිෂ්‍යත්ව වැඩසටහන	රු.බි.	1.7
වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර, ප්‍රායෝගික පුහුණු වැඩපළ සහ ආපනශාලා ඉදිකිරීම	රු.බි.	0.8
පුනර්ජනනීය බලශක්ති පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම	රු.බි.	0.2
නවීන රැකියා වෙළඳපොළට ගැලපෙන පරිදි පුහුණු සැසි පැවැත්වීම, විෂයමාලා සංවර්ධනය සහ කුසලතා පුරෝකථන පද්ධති සකස් කිරීම	රු.බි.	1.7
වෘත්තීය පුහුණු සිසුන් සඳහා ප්‍රවේශපත්‍ර	රු.බි.	0.16

රු.බි. 5.4

විද්‍යාව සහ තාක්ෂණය - දැනුම සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය ශක්තිමත් කිරීම



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	1.27	ග්‍රාමීය ප්‍රදේශවලට තාක්ෂණය ලබාදීමේ “විදතා” වැඩසටහන
රු.බි.	0.16	ග්‍රහලෝකාගාර නඩත්තු හා මෙහෙයුම්

සැමට ආරක්ෂිත, විශ්වසනීය හා කාර්යක්ෂම ප්‍රවාහන සේවයක්

ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන සබඳතා පුළුල් කිරීම - ජනතාව, ව්‍යාපාර සහ ප්‍රජාවන් හට වඩාත් ගුණාත්මක ප්‍රවාහන සේවාවක්

ප්‍රාග්ධන වියදම
රු.බි. 399.5

පුනරාවර්තන වියදම
රු. බි. 58.65

2027
රු.බි. 458

	එකතුව	ප්‍රාග්ධන	රු.බි. පුනරාවර්තන
මාර්ග	294.8	285.5	9.3
පාලම්	19.2	19.2	-
දුම්රිය මාර්ග	95.6	56.8	38.8
ප්‍රවාහන	45.15	35.0	10.05
වරාය හා ගුවන් සේවා	3.7	3.0	0.7



2027 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි. 294.8

මාර්ග

- අධිවේගී මාර්ග ජාලය පුළුල් කිරීම
- වඩාත් ගුණාත්මක මාර්ග ඉදිකිරීම
- ග්‍රාමීය ප්‍රදේශ අතර සබඳතා ඉහළ නැංවීම
- ප්‍රවාහන ආරක්ෂාව ශක්තිමත් කිරීම

රු.බි. 100.3

අධිවේගී මාර්ග ජාලය පුළුල් කිරීම - රට පුරා මගී සහ භාණ්ඩ ප්‍රවාහනය කඩිනම් කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත සිට මීරිගම දක්වා සහ පොතුහැර සිට ගලගෙදර දක්වා මාර්ග බණ්ඩ ඇතුළු ප්‍රමුඛතා අධිවේගී මාර්ග ව්‍යාපෘති අබණ්ඩව ක්‍රියාත්මක කිරීම	රු.බි.	79.0
කුළුණු මතින් ඉදි වන වරාය පිවිසුම් අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අබණ්ඩව සිදු කිරීම	රු.බි.	10.7
කුරුණෑගල - දඹුල්ල අධිවේගී මාර්ගයේ මූලික කටයුතු සිදු කිරීම	රු.බි.	3.2
කහතුඩුව සිට ඉංගිරිය දක්වා අධිවේගී මාර්ගයේ මූලික කටයුතු සිදු කිරීම	රු.බි.	2.0

රු.බි. 89

වඩාත් ආරක්ෂිත හා කඩිනම් ගමන් බිමන් සඳහා මාර්ග වැඩිදියුණු කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	31.2	ජාතික මාර්ග කි.මී. 12,600ක් පමණ නඩත්තු හා වැඩිදියුණු කිරීම
රු.බි.	22.0	ජාතික මාර්ග ජාලයෙහි තෝරාගත් මාර්ග කොටස් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම
රු.බි.	10.0	රත්නපුර සිට නාම්බපාන දක්වා සහ කටුගස්තොට සිට ගලගෙදර දක්වා වූ මාර්ග කොටස් ඇතුළු ප්‍රමුඛතා මාර්ග සංවර්ධනය කිරීම
රු.බි.	11.0	ජාතික මාර්ග ජාලයෙහි පාලම් සහ ඊට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
රු.බි.	3.5	මාර්ග වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම
රු.බි.	0.4	බේස්ලයින් මාර්ගයේ පිහිටි මංසන්ධි 11ක් වැඩිදියුණු කිරීම
රු.බි.	1.9	මහනුවර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය ආශ්‍රිතව සහ අලව්ව හා මුත්තෙට්ටුගල දුම්රිය මාර්ග හරහා ගුවන් පාලම් ඉදිකිරීම.
රු.බි.	1.5	කිරාන්, පොන්ඩුකුලව්චේනයි, කෝකිලායි කලපුව හරහා සහ පුන්නියඩි තොටුපළ මාර්ගයේ පාලම් ඉදිකිරීම.

රු.බි. 4.4

ප්‍රවාහන ආරක්ෂාව සවිමත් කිරීම – අනතුරු අවම, වඩාත් ආරක්ෂිත ගමනාගමන පහසුකම්

ප්‍රධාන ක්‍රියාකාරකම්

මාර්ග ජාලයේ අනතුරුදායක ස්ථානවල ආරක්ෂක වැටක් ඇතුළු මාර්ග ආරක්ෂාවට අදාළ යටිතල පහසුකම් ඉදිකිරීම	රු.බි.	2.1
ඩිජිටල් රියදුරු අකුසලතා ක්‍රමවේදය සහ මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ පද්ධතිය හඳුන්වා දීම - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ රියදුරු දඬුවම් ලකුණු පද්ධතිය ක්‍රියාත්මක කිරීම.	රු.බි.	1.5

රු.බි. 80.5

ග්‍රාමීය සබඳතාවය වැඩිදියුණු කිරීම – රැකියා, වෙළෙඳපොළ සහ අත්‍යවශ්‍ය සේවා වෙත වඩාත් පහසු ප්‍රවේශයක්

ප්‍රධාන ක්‍රියාකාරකම්



රු.බි.	31.0	දිවයින පුරා ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 2,000ක් පමණ වැඩිදියුණු කිරීම
රු.බි.	22.0	දීප ව්‍යාප්ත ග්‍රාමීය මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම
රු.බි.	7.5	ග්‍රාමීය පාලම් සංවර්ධනය කිරීම
රු.බි.	20.0	පළාත්බද මාර්ග නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම

රු.බි. 45.15

පොදු ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීම – වඩාත් විශ්වසනීය, පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ සුවපහසු පොදු ප්‍රවාහන සේවාවක්



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	14.0	මහනුවර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම
රු.බි.	6.0	දුරගමන් සේවා සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම.) යටතේ සුඛෝපභෝගී බස් රථ 600ක් මිලදී ගැනීම
රු.බි.	2.2	ශ්‍රී ලං.ග.ම. බස් රථ ඇණිය නඩත්තු කිරීම සඳහා සහාය ලබා දීම
රු.බි.	0.4	පොකුරු බස් රථ මෙහෙයුම් ආකෘතිය සහ ශ්‍රී ලං.ග.ම. ඩිජිටල් පරිවර්තනයට ලක් කිරීම
රු.බි.	4.0	ලාභ නොලබන මාර්ගවල ශ්‍රී ලං.ග.ම. බස් රථ ධාවනය කිරීම සඳහා ගෙවීම් සිදු කිරීම
රු.බි. .	4.5	නාගරික ප්‍රදේශවලට විදුලි බස් රථ හඳුන්වා දීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම
රු.බි.	1.5	නිසි සැරිය සහ රාත්‍රී කාලයේ ධාවනය වන බස් රථ සේවා අබණ්ඩව පවත්වාගෙන යාම සඳහා රජයේ දායකත්වය (සිසු සැරිය හැර)

රු.බි. 95.6

දුම්රිය ප්‍රවාහන පද්ධතිය ශක්තිමත් කිරීම - විශ්වසනීය, සුවපහසු හා තිරසාර ගමනාගමනය



ප්‍රධාන ක්‍රියාකාරකම්

දුම්රිය ඇණිය ප්‍රතිසංස්කරණය කිරීම	රු.බි.	9.0
දුම්රිය මාර්ග සහ සංඥා පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම	රු.බි.	8.6
දුම්රිය ඇණියට නව දුම්රිය 5ක් එක් කිරීම	රු.බි.	5.0
දුම්රිය ස්ථාන සහ මඟී පහසුකම් වැඩිදියුණු කිරීම	රු.බි.	2.0
පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා දුම්රිය මාර්ගය ද්විත්ව මාර්ගයක් බවට පරිවර්තනය කිරීම	රු.බි.	4.0
කැලණි ගඟ මතින් දිවෙන පාලම ඇතුළු දුම්රිය පාලම් 11ක් ප්‍රතිස්ථාපනය කිරීම	රු.බි.	3.3
මඟී දුම්රිය මැදිරි ප්‍රතිසංස්කරණය කිරීම සහ නව මැදිරි මිලදී ගැනීම	රු.බි.	1.1

රු.බි. 3.7

වරාය හා ගුවන් සේවා – ගෝලීය වෙළෙඳපොළ තුළ තරඟකාරීත්වය ඉහළ නැංවීම සඳහා වැඩිදියුණු කළ ප්‍රවාහන හා සැපයුම් සේවා



ප්‍රධාන ක්‍රියාකාරකම්

කොළඹ වරාය සංවර්ධනය

කන්කසන්තුරේ වරාය සංවර්ධනය



යහපත් ජීවන තත්ත්වයක් පවත්වාගෙන යෑම සඳහා සහායවීම

සෑම පවුලක් සඳහාම සුදුසු නිවාස, පහසුකම් සහ අවස්ථා

2027
රු.බි. 208.6

ප්‍රාග්ධන වියදම
රු.බි. 195.7

පුනරාවර්තන වියදම
රු. බි. 12.9

	එකතුව	ප්‍රාග්ධන	රු.බි. පුනරාවර්තන
පානීය ජල සැපයුම	77.9	77.2	0.71
නිවාස	64.1	61.7	2.4
ග්‍රාමීය සංවර්ධනය	42.0	42.0	0.09
තරුණ හා ක්‍රීඩා කටයුතු	17.0	8.5	8.5
නාගරික ප්‍රදේශවල යටිතල පහසුකම් දියුණු කිරීම	7.4	6.2	1.2



රු.බි. 77.9

පානීය ජල සැපයුම - සුරක්ෂිත පානීය ජලය සඳහා විශ්වාසනීය ප්‍රවේශයක් සහිත නිවාස



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**10.0**	පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමවල ධාරිතාවය හා බෙදහැරීම වැඩිදියුණු කිරීම
රු.බි.	**4.0**	යාපනය, කිලිනොච්චිය සහ අවට ප්‍රදේශ සඳහා නල ජලය සැපයීම
රු.බි.	**4.5**	වීප්පාවල, ගිරිබාව, රාජාංගනය සහ නොච්චියාගම ප්‍රදේශ සඳහා ජල සැපයුම පුළුල් කිරීම
රු.බි.	**6.6**	කැබිතිගොල්ලෑව, හොරොව්පතාන, පදවිය, කහටගස්දිගිලිය ප්‍රදේශවල ග්‍රාම නිලධාරී කොට්ඨාශ 119ක් සඳහා නල ජලය සැපයීම
රු.බි.	**5.6**	කැස්බෑව, පාදුක්ක, මොරටුව, හෝමාගම, රත්මලාන, දෙහිවල, බණ්ඩාරගම, බුලත්සිංහල, ඉංගිරිය, පානදුර, කළුතර, හොරණ, මදුරාවල සහ මිල්ලනිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම නිලධාරී කොට්ඨාශ 654ක නල ජල සැපයුම් සේවා වැඩිදියුණු කිරීම.
රු.බි.	**3.0**	මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර, අකුරණ, හාරිස්පත්තුව, පූජාපිටිය, මහනුවර කඩවත් සතර සහ තුම්පනේ ප්‍රදේශවල නල ජල සැපයුම පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා දැනට පවතින ජල සම්පාදන යෝජනා ක්‍රම පුළුල් කිරීම
රු.බි.	**3.0**	ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රම 3,700ක් පමණ නඩත්තු කිරීම
රු.බි.	**3.0**	ගාල්ල නගරය සහ අවට ප්‍රදේශයෙහි නල ජල සැපයුම පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම

රු.බි. 42.0



ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම – වැඩිදියුණු කළ ග්‍රාමීය යටිතල පහසුකම් සහ වැඩි අවස්ථාවන් ලබාදීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

ප්‍රජාශක්ති ජාතික වැඩසටහන	**රු.බි.**	**25.0**
උතුරු, නැඟෙනහිර, උතුරු මැද සහ ඌව පළාත්වල ග්‍රාමීය මාවත්, මධ්‍ය හා සුළු පරිමාණ වාරිමාර්ග හා ග්‍රාමීය ජල සැපයුම් පහසුකම් වැනි මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	**රු.බි.**	**7.7**
ප්‍රාදේශිය මට්ටමේ කඩිනම් අවශ්‍යතා සහ සේවා වැඩිදියුණු කිරීම	**රු.බි.**	**2.2**
ප්‍රාදේශිය තුලිතතාවය වැඩිදියුණු කිරීම	**රු.බි.**	**7.0**

රු.බි. 7.4

නාගරික යටිතල පහසුකම් සංවර්ධනය –නගරවල පොදු ස්ථාන, සේවා සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**1.0**	රත්නපුර නගර සංවර්ධනය යටතේ රජයේ සේවකයන් සඳහා නිල නිවාස ඉදිකිරීම
රු.බි.	**1.3**	මඩු පූජා ප්‍රදේශයේ සහ දෙයියන්දර පහසුකම් සංවර්ධනය කිරීම
රු.බි.	**0.5**	මහා නගර 100ක නාගරික යටිතල පහසුකම් සහ නගර සංවර්ධන කටයුතු අඛණ්ඩව කරගෙන යෑම
රු.බි.	**0.47**	අනුරාධපුරය සහ යාපනය ඇතුළුව උපායමාර්ගික නගර සංවර්ධනය කිරීම
රු.බි.	**0.7**	යාපනය නගර ශාලාව යළි ඉදිකිරීම
රු.බි.	**0.15**	රත්ගම නගරය සංවර්ධනය කිරීම

ගුණාත්මක සහ දැරිය හැකි මිලකට නිවාස සැපයීම - අවදානම් තත්ත්වයේ සිටින පවුල් සඳහා වඩාත් සුරක්ෂිත හා දැරියහැකි මිලකට නිවාස ලබාදීම

රු.බි. 64.1

ප්‍රධාන ක්‍රියාකාරකම්

කොළඹගේ මාවත, ටොරින්ටන්, මිතොටමුල්ල, විල්ගොඩ, ෆර්ගියුසන් පාර, ස්ටේඩියම්ගම,ඔබේසේකරපුර, සහ කිඹුලාඇල අඩු පහසුකම් සහිත ජනාවාස වෙනුවට තවත් නිවාස 1,600ක් නිමා කිරීම, නිවාස 4,000ක පමණ ඉදිකිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකිරීම හා නව නිවාස 2,000ක් පමණ අලුතින් ඉදිකිරීම ආරම්භ කිරීම	**රු.බි.**	**20.3**
මොරටුව,කොට්ටාව, දෙමටගොඩ, මහරගම සහ පෑලියගොඩ ප්‍රදේශවල පුද්ගලයින් නැවත පදිංචි කිරීම සඳහා නිවාස ඒකක 1,996ක් ඉදිකිරීමේ කටයුතු අඛණ්ඩව සිදුකිරීම	**රු.බි.**	**6.5**
'තමන්ගේම තැනක් - ලස්සන ජීවිතයක් 'නිවාස වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී සහ දුගී පවුල් 10,000ක් සඳහා මූල්‍ය සහාය ලබාදීම	**රු.බි.**	**13.0**
වතු ජනතාව සඳහා නිවාස 2,800ක් පමණ ඉදිකිරීම	**රු.බි.**	**2.8**
ආරාමය පෙදෙස නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය	**රු.බි.**	**2.1**
දකුණු පළාතේ නිවාස 775ක ඉතිරි වැඩ නිමකිරීම	**රු.බි.**	**0.3**
මන්නාරම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස 96ක ඉතිරි වැඩ නිමකිරීම	**රු.බි.**	**0.1**
ආයතනගත රැකවරණ යටතේ සිටින පුද්ගලයන් නැවත සමාජගත කිරීම සහ ළමා ආරක්ෂාව සඳහා නිවාස ඉදිකිරීමට සහාය ලබාදීම	**රු.බි.**	**2.0**
ගැටුම් මඟින් පීඩාවට පත් වූ පවුල් සඳහා නිවාස ඉදිකිරීම සම්පූර්ණ කිරීම	**රු.බි.**	**6.0**
නායයෑම් අවදානම්වල බලපෑමට ලක්වන පවුල් නැවත පදිංචි කිරීම	**රු.බි.**	**3.2**
නිවාස යෝජනා ක්‍රමවල පොදු පහසුකම්, ගොඩනැගිලි, අපජලය බැහැර කිරීමේ පද්ධති, සෝපාන සහ අනෙකුත් පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම	**රු.බි.**	**4.2**

තරුණ හා ක්‍රීඩා කටයුතු – සහභාගිත්වය, කුසලතා සංවර්ධනය හා නිරෝගිමත් දිවිපෙවෙතක් ගත කිරීම සඳහා වැඩි අවස්ථා

රු.බි. 17.0

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**2.5**	ක්‍රීඩා උපකරණ ලබාදීම, ක්‍රීඩා යටිතල පහසුකම් දියුණු කිරීම සහ පුහුණු ලබාදීම ඔස්සේ ක්‍රීඩා සංස්කෘතියක් ස්ථාපනය කිරීම
රු.බි.	**1.8**	සුගතදාස ක්‍රීඩා සංකීර්ණය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම
රු.බි.	**0.35**	ජාතික සංචිතවල සාමාජිකයන් සඳහා පෝෂණය නඟා සිටුවීම
රු.බි.	**0.3**	ඉහළ දක්ෂතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පහසුකම් සැලසීම
රු.බි.	**0.34**	පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා සංකීර්ණ ඉදිකිරීම
රු.බි.	**0.7**	ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරඟ පැවැත්වීම
රු.බි.	**0.35**	ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවල දී සහභාගිත්වය සඳහා පහසුකම් සැලසීම



ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් ගොඩනැඟීම

ආහාර නිෂ්පාදනය හා ගොවි ජනතාවගේ ජීවනෝපාය ශක්තිමත් කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාවෙන් යුත් කෘෂිකාර්මික ආර්ථිකයක් ගොඩනැඟීම

2027
රු.බි. 273

ප්‍රාග්ධන වියදම
රු.බි. 154.2

පුනරාවර්තන වියදම
රු.බි. 118.8

	එකතුව	ප්‍රාග්ධන	රු.බි. පුනරාවර්තන
කෘෂිකර්මාන්තය	123.0	45.2	77.7
වාරිමාර්ග	93.0	80.4	12.6
පශු සම්පත්	9.4	8.1	1.2
වැවිලි	22.5	9.3	13.1
ධීවර	11.7	7.4	4.3
ඉඩම්	13.4	3.8	9.6



2027 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි. 123 කෘෂිකර්මාන්තය

කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම

අවදානම් සහ විපර්යාසයන් හමුවේ ගොවීන්ට සහාය වීම

කෘෂිකාර්මික ඵලදායිතාව වර්ධනය කිරීම – ඉහළ ඵලදායිතාවක්, ශක්තිමත් ආහාර නිෂ්පාදනයක් සහ ගොවි ජනතාවට වැඩි ආර්ථික අවස්ථා

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**8.7**	සුළු පරිමාණ කෘෂි ආහාර නිෂ්පාදකයන්ගේ ඵලදායිතාව, වෙළෙඳපොළ ප්‍රවේශය සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම මෙන්ම වාරි කර්මාන්ත වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.
රු.බි.	**4.5**	දේශගුණික විපර්යාසවලට ගොදුරු වීමේ අවදනමක් පවතින දිස්ත්‍රික්ක හයක්—පුත්තලම, කුරුණෑගල, මාතලේ, අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල ග්‍රාමීය සුළු පරිමාණ ගොවි පවුල් 40,000ක ජීවනෝපාය සහ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම.
රු.බි.	**2.1**	බීජ නිෂ්පාදනය, මිලදී ගැනීම සහ බීජවල ගුණාත්මකභාවය තහවුරු කිරීම.
රු.බි.	**13.5**	පළාත්බද්ද කෘෂිකාර්මික සංවර්ධනය.



අවදානම් හමුවේ ගොවීන් හට සහාය වීම - ඔරොත්තු දීමේ ශක්තියෙන් යුත් ගොවීන් සහ කෘෂිකාර්මික ජීවනෝපායන්හි වැඩි ස්ථාවරත්වයක්

ප්‍රධාන ක්‍රියාකාරකම්

පොහොර සහනාධාර වැඩසටහන	**රු.බි.**	**44.0**
ගොවි විශ්‍රාම වැටුප්	**රු.බි.**	**5.2**
වී, බඩඉරිඟු, අර්තාපල්, මිරිස්, ලොකු ළූණු සහ සෝයා බෝංචි සඳහා අනිවාර්ය බෝග රක්ෂණ යෝජනා ක්‍රමය	**රු.බි.**	**1.5**
අපනයන බෝග සංවර්ධනය සඳහා සහාය	**රු.බි.**	**1.1**

රු.බි. 11.7

ධීවර සහ වෙරළබඩ ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය කිරීම – ධීවර ප්‍රජාවන් සඳහා වැඩිදියුණු කළ පහසුකම් සහ වඩාත් ශක්තිමත් ධීවර ජීවනෝපායන්



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**1.5**	ගන්දර ධීවර වරාය ඉදිකිරීම
රු.බි.	**1.4**	මයිලිඩ්ඩි, වැල්ලමන්කර ජැටිය, පානදුර, බේරුවල, හික්කඩුව, අම්බලන්ගොඩ, දෙඩන්දූව, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, කුඩාවැල්ල, තංගල්ල සහ නිල්වැල්ල ඇතුළු ධීවර වරායන් 16ක් සංවර්ධනය කිරීම
රු.බි.	**0.6**	මුහුදු කූඩැල්ලන් වගාවට අදාළ පර්යේෂණ, නවෝත්පාදන තාක්ෂණය සහ වාණිජකරණය
රු.බි.	**0.4**	ධීවර යාත්‍රා, මත්ස්‍ය ගබඩා ටැංකි සහ ධීවර උපකරණ නිෂ්පාදනය කිරීම මෙන්ම ඉවතලන ධීවර දැල් සහ සාගර ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් හඳුන්වා දීම
රු.බි.	**0.7**	ජාතික ධීවර තත්ත්ව සහතිකකරණය, ආරක්ෂණ සහ සම්බන්ධීකරණය කරන ලද ජාතික රසායනාගාර ජාල ව්‍යාපෘතිය
රු.බි.	**0.3**	පුත්තලම, මන්නාරම, කිලිනොච්චිය සහ යාපනය යන දිස්ත්‍රික්කවල සාගර සම්පත් විද්‍යාත්මකව කළමනාකරණය කිරීම සහ පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය කිරීම

රු.බි. 93

කෘෂිකර්මාන්තය සඳහා ජල සුරක්ෂිතතාව තහවුරු කිරීම – ගොවිතැන් කටයුතු සඳහා වඩාත් විශ්වාසදායක ජල සැපයුමක් සහ නියඟයට ඔරොත්තු දීමේ හැකියාව

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**6.5**	දිවයින පුරා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම
රු.බි.	**3.8**	මහවැලි වාරිමාර්ග පද්ධතිය නඩත්තු කිරීම
රු.බි.	**2.0**	මුලතිව් සහ වව්නියා දිස්ත්‍රික්ක සඳහා වාරි ජලය සැපයීම පිණිස කිවුල් ඔය ජලාශය ඉදිකිරීම
රු.බි.	**2.0**	දිවයින පුරා සුළු වාරිමාර්ග, ඇළ පද්ධති සහ ග්‍රාමීය වැව් වැඩිදියුණු කිරීම
රු.බි.	**1.5**	මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධනය කිරීම
රු.බි.	**10.9**	සොරොව්, සුළු ඇළ මාර්ග, අමුණු සහ කුඹුරු ඇළ මාර්ග 254ක්, වැව් 134ක්, ඇළ මාර්ග ඉදිකිරීම් 847ක් සහ වේලි 33ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීම
රු.බි.	**5.5**	දිවයින පුරා වැව් 42ක් සහ ඇළ මාර්ග 82ක් ප්‍රතිසංස්කරණය කිරීම.
රු.බි.	**2.0**	දිවයින පුරා ග්‍රාමීය වාරිමාර්ග යෝජනා ක්‍රම 125ක් ප්‍රතිසංස්කරණය කිරීම
රු.බි.	**2.5**	දිස්ත්‍රික්ක කිහිපයක් පුරා පිහිටි කුඩා වාරි ජලාශ, අමුණු, වේල්ලංගා පද්ධති, ඇළ මාර්ග සහ ග්‍රාමීය ජල පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමේ "වාරි මහිම" වැඩසටහන.
රු.බි.	**2.6**	දිවයින පුරා ජලාශ 241ක් සහ අමුණු 113ක් ප්‍රතිසංස්කරණය කිරීම
රු.බි.	**7.5**	පහළ මල්වතු ඔය පද්ධතිය සංවර්ධනය කිරීම (වේල්ල සහ වාන් දෙරටු ඉදිකිරීම, නිවාස ඇතුළු ජනතාව නැවත පදිංචි කිරීමේ පහසුකම් සැලසීම, විදුලි වැට ඉදිකිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීම)
රු.බි.	**19.5**	මොරගහකන්ද ජලාශයේ සිට මහකනදරාව දක්වා හුරුළුවැව, මානන්කට්ටිය සහ වීරුවැව සම්බන්ධ කරමින් උතුරු මැද පළාත් ඇළ මාර්ගය ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම. මෙම ව්‍යාපෘතිය මඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන, කහටගස්දිගිලිය, රඹෑව, මධ්‍යම නුවරගම් පළාත, මිහින්තලේ, පලුගස්වැව, කැකිරාව, ගලෙන්බිඳුණුවැව සහ තිරප්පනේ යන ප්‍රදේශවල මෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇළහැර ප්‍රදේශයේ ගොවීන්ට ප්‍රතිලාභ සැලසෙනු ඇත
රු.බි.	**0.7**	අලිකොට ආර සහ කුඩා ඔය ජලාශ ඉදිකිරීම (උමා ඔය)
රු.බි.	**1.0**	ඇල්ලේවැව ජලාශයේ ප්‍රධාන වේල්ල, පිටවාන සහ පිට සෙරොව්ව ඉදිකිරීම, රාජාංගණය උස්සාන වාරිමාර්ග යෝජනා ක්‍රමය නවීකරණය කිරීම සහ සියඹලන්ගමුව ඔයේ සිට මහගල්ගමුව වැව දක්වා වූ පෝෂක ඇළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම

රු.බි. 9.4

පශු සම්පත් හා කිරි නිෂ්පාදනය සවිමත් කිරීම – ඉහළ ඵලදායිතාවයෙන් යුතු පශු සම්පත්, ස්ථාවර ගොවි ආදායමක් සහ දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම

ප්‍රධාන ක්‍රියාකාරකම්



බඩල්ගම කිරි සැකසුම් කර්මාන්තශාලාව	**රු.බි.**	**3.0**
කිරි නිෂ්පාදන අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම	**රු.බි.**	**1.0**
වීළු ගොවිතැන ආශ්‍රිත ජීවනෝපාය ප්‍රවර්ධනය කිරීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ගොවිපළ සඳහා සහනාධාර සහිත යෙදවුම් ලබා දීම	**රු.බි.**	**0.2**
සත්ත්ව අභිජනන ගොවිපළ ස්ථාපනය කිරීම	**රු.බි.**	**1.0**
බැටළුවන් 2,000ක් ආනයනය කිරීම	**රු.බි.**	**1.0**

රු.බි. 22.5

වැවිලි ප්‍රජාවන් සහ නිෂ්පාදනය ශක්තිමත් කිරීම – වැවිලි අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම සහ සුළු පරිමාණ වගාකරුවන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**3.8**	වතු කම්කරුවන් සඳහා දිරි දීමනා
රු.බි.	**3.0**	නුවරඑළිය, බදුල්ල, මහනුවර, රත්නපුර, කෑගල්ල, මාතලේ, කුරුණෑගල, මාතර, ගාල්ල, කළුතර, කොළඹ සහ මොණරාගල යන දිස්ත්‍රික්කවල වතු ආශ්‍රිතව සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, ජල පහසුකම් සැපයීම, "ප්‍රජාශක්ති මධ්‍යස්ථාන" වැඩිදියුණු කිරීම සහ වතු මාර්ග සංවර්ධනය කිරීම.
රු.බි.	**0.65**	උතුරු පොල් ත්‍රිකෝණය ස්ථාපනය කිරීම

අවදානම් සඳහා ගොවීන් හට සහාය වීම

- **රු.බි. 1.15** නව රබර් වගා ආරම්භ කිරීම සහ අත්හැර දමා ඇති පැරණි රබර් වගාවන් නැවත වගා කිරීම සඳහා සහනාධාර ලබා දීම
- **රු.බි. 1.5** කුඩා තේ වතු නැවත වගා කිරීම
- **රු.බි. 3.4** පොල් වගාව සඳහා සහාය ලබා දීම
- **රු.බි. 0.4** කුරුඳු කර්මාන්තය පුනර්ජීවනය කිරීම සඳහා ගොවීන්ට සහාය වීම

රු.බි. 13.4

වඩාත් ඵලදායී ඉඩම් පරිහරණය – විධිමත් ඉඩම් පරිහරණය සහ වඩාත් සුරක්ෂිත ඉඩම් හිමිකාරිත්වයක්



ප්‍රධාන ක්‍රියාකාරකම්

රජයේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම	**රු.බි.**	**1.4**
බිම් සවිය වැඩසටහන	**රු.බි.**	**0.8**
ඉඩම් මැනුම් කටයුතු	**රු.බි.**	**0.5**



සදාහරිත දිවිපෙවෙතක්

ප්‍රාග්ධන වියදම
රු.බි. 45.5

පුනරාවර්තන වියදම
රු.බි. 16.5

2027
රු.බි. 62.2

	එකතුව	ප්‍රාග්ධන	රු.බි. පුනරාවර්තන
වෙරළ සංරක්ෂණය	5.8	5.3	0.5
ආපදා කළමනාකරණය	15.2	11.57	3.5
පරිසර කළමනාකරණය	10.5	4.0	6.5
අපජල කළමනාකරණය	12.7	12.7	
වැසි ජල කළමනාකරණය	7.7	7.7	
ඝන අපද්‍රව්‍ය කළමනාකරණය	3.7	3.7	
වනජීවී ආරක්ෂණය	6.5	0.43	6.1



2027 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි. 15.2

ආපදා අවදානම් අවම කිරීම - මනාව සූදානම් වූ ප්‍රජාවන් සහ ඉක්මන් ප්‍රතිචාර දැක්වීම



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	2.69	පුත්තලම ඩොප්ලර් (Doppler) කාලගුණ රේඩාර් පද්ධතිය ස්ථාපිත කිරීම
රු.බි.	3.6	උඩරට දුම්රිය මාර්ගය සහ නායයෑම් අවදානමක් සහිත පාසල් ඇතුළු අවදානම් සහිත ප්‍රදේශවල නායයෑම් අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම
රු.බි.	1.0	ආපදාවන්ට ඔරොත්තු දීමේ හැකියාව සහිත ආරක්ෂිත මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම
රු.බි.	1.7	ගංවතුර සහ නියං සහන
රු.බි.	0.5	බහු ආපදා වර්ග පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ සන්නිවේදන පද්ධතියක් ස්ථාපිත කිරීම
රු.බි.	0.5	සුනාමි අනතුරු ඇඟවීමේ කුළුණු ඇතුළුව, හදිසි අවස්ථාවලදී ප්‍රතිචාර දැක්වීමේ සහ පූර්ව අනතුරු ඇඟවීමේ හැකියාවන් ශක්තිමත් කිරීම
රු.බි.	0.5	ගංවතුර සහ නායයෑම්වලින් පීඩාවට පත් ප්‍රදේශ පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම

රු.බි. 12.7



අපජල කළමනාකරණය – පිරිසිදු ජලය සහ සෞඛ්‍යමත් ප්‍රජාවන්

ප්‍රධාන ක්‍රියාකාරකම්

කොළඹ නගර සභා බල ප්‍රදේශය සහ තදාසන්න ප්‍රදේශවල නළ මඟින් අපජල රැස්කිරීම, ප්‍රවාහනය සහ පිරිපහදු කිරීමේ පද්ධතිය සංවර්ධනය කිරීම	රු.බි.	9.5
මහනුවර නගරය සහ ඒ අවට ප්‍රදේශවල අපජලය එකතු කිරීම සහ පිරිපහදු කිරීම	රු.බි.	1.2
මොරටුව සහ ඒකල ප්‍රදේශවල අපජලය එකතු කිරීම සහ පිරිපහදු කිරීම	රු.බි.	1.0
ඇල්ල නගරය සඳහා අපජල කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම	රු.බි.	0.74
ඉඹිබාගමුව, වැලිගෙපොල, බදුල්ල, ලිඳුල සහ කිලිනොච්චිය ඇතුළුව දිවයින පුරා මල අපද්‍රව්‍ය (Fecal Sludge) කළමනාකරණය වැඩිදියුණු කිරීම	රු.බි.	0.2

රු.බි. 3.7

විධිමත් ලෙස අපද්‍රව්‍ය කළමනාකරණය - සුපිරිසිදු ප්‍රජාවක් සහ නිසි අපද්‍රව්‍ය කළමනාකරණයක් උදෙසා



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	0.7	අනුරාධපුරයේ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම
රු.බි.	0.56	ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඝන අපද්‍රව්‍ය වෙන් කර හඳුනාගත හැකි විශේෂිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන ලබා දීම සඳහා දිවයින පුරා පිහිටි පළාත් පාලන ආයතන 54ක් වෙත සහාය ලබා දීම.
රු.බි.	0.16	කෙරවලපිටිය අපද්‍රව්‍ය කළමනාකරණ උද්‍යානය (Waste-management park) ආරම්භ කිරීම.
රු.බි.	2.2	අරුවක්කාලු අපද්‍රව්‍ය කළමනාකරණ පරිශ්‍රය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම

රු.බි. 10.5

පරිසර කළමනාකරණය – අනාගත පරපුර උදෙසා හිතකර පරිසරයක්



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	1.0	ප්‍රධාන වශයෙන් නැවත වගාකිරීම මගින් වන ආවරණය ව්‍යාප්ත කිරීම
රු.බි.	0.6	මධ්‍යම ඉහළ ජල පෝෂක ප්‍රදේශවල පාරිසරික ප්‍රතිෂ්ඨාපනය සහ කළමනාකරණ වැඩසටහන
රු.බි.	0.34	අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම
රු.බි.	0.12	ආහාර අංශය තුළ චක්‍රීය ආර්ථිකය (Circular Economy) ප්‍රවර්ධනය කිරීම

රු.බි. 6.5



වනජීවී – වනජීවීන් ආරක්ෂා කිරීම, මිනිස්-වනජීවී ගැටුම් අවම කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

කිලෝමීටර් 555ක් පමණ දිගු විදුලි වැටවල් ඉදිකිරීම (මීට අමතරව, පහළ මල්වතු ඔය ව්‍යාපෘතිය යටතේ තවත් කිලෝමීටර් 6.7ක් පමණ දිගු විදුලි වැටක් ඉදිකෙරෙමින් පවතී)	රු.බි.	0.25
දැනට පවතින විදුලි වැටවල් නඩත්තු කිරීම	රු.බි.	0.5

රු.බි. 7.7

වැසි ජල කළමනාකරණය - ගංවතුරින් තොර නාගරික ප්‍රදේශ



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	3.4	ඔලියමුල්ල, කොලොන්නාව, මුදුන් ඇළ (පෑලියගොඩ), පිළියන්දල අතුරු මාර්ගය සහ බිඳුණු ඇළ යන ප්‍රදේශවල වැසි ජල කළමනාකරණය
රු.බි.	0.2	කොළඹ සහ ඒ අවට ප්‍රදේශවල වැසි ජල පොම්පාගාර (storm water pumping stations) ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව
රු.බි.	0.38	බෙරුවල, දික්වැල්ල ප්‍රදේශවල වැසි ජල බැහැර කිරීමේ පද්ධති සහ පොදු පහසුකම් වැඩිදියුණු කිරීම
රු.බි.	0.60	ගංවතුර පාලනය සඳහා කළුපාලම ස්ථානයේ ජල පොම්ප ස්ථාපනය කිරීම
රු.බි.	1.49	නාගරික ප්‍රදේශවල ගංවතුර ආපදා සඳහා හදිසි ප්‍රතිචාර සැලසුම් සකස් කිරීම සහ ඇලමාර්ග ඇතුලු අනෙකුත් නඩත්තු කටයුතු



සාමකාමී සහ සාධාරණ සමාජයක් සඳහා කැපවීම

මහජනතාව ආරක්ෂා කිරීම, අධිකරණ කටයුතු ශක්තිමත් කිරීම සහ සැමට සහභාගි විය හැකි සමාජයක් ගොඩනැගීම

2027
රු.බි. 342

ප්‍රාග්ධන වියදම
රු.බි. 55.7

පුනරාවර්තන වියදම
රු.බි. 286.7

	එකතුව	ප්‍රාග්ධන	රු.බි. පුනරාවර්තන
මහජන ආරක්ෂාව	236.1	23.9	212.1
අධිකරණ, බන්ධනාගාර ළමා සහ කාන්තා	73.2	21.2	52.04
සංස්කෘතිය සහ ආගම	17.48	6.9	10.55
ප්‍රජාතන්ත්‍රවාදය සහ ජනමාධ්‍ය	15.54	3.64	11.9



2027 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි. 236.1

මහජන ආරක්ෂාව – වඩාත් ආරක්ෂිත ප්‍රජාවන් සහ වඩාත් සුරක්ෂිත මහජන සේවාවන්



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**136.5**	අපරාධ සහ රථවාහන නීති බලාත්මක කිරීම සහ මහජන සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම වෙනුවෙන් පොලිසිය සඳහා වන වැටුප් සහ වේතන
රු.බි.	**3.1**	විදේශ ගමන් ලේඛන, විදේශ ගමන් බලපත්‍ර සහ ඒ ආශ්‍රිත සේවාවන්
රු.බි.	**2.4**	අනෙකුත් රටවල් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීම (Advanced passenger information system)
රු.බි.	**1.0**	ස්වයංක්‍රීය දොරටු (E-gates) පහසුකම් ස්ථාපනය කිරීම
රු.බි.	**1.5**	සුරක්ෂිත ඩිජිටල් හැඳුනුම්පත් පද්ධතිය ස්ථාපනය කිරීම
රු.බි..	**1.3**	පූර්ව මුද්‍රිත හැඳුනුම්පත් කාඩ්පත් සහ ඊට අදාළ කටයුතු
රු.බි..	**0.75**	ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පවතින පද්ධති වැඩිදියුණු කිරීම

රු.බි. 73.2



අධිකරණ කටයුතු සහ බන්ධනාගාර

ප්‍රධාන ක්‍රියාකාරකම්

ගාල්ල, වලපනේ, කඩුවෙල, අනුරාධපුර, පොළොන්නරුව, මාතලේ, යාපනය, කිලිනොච්චිය, තෙල්දෙණිය, පූගොඩ සහ කන්තලේ අධිකරණ සංකීර්ණ සංවර්ධනය	**රු.බි.**	**0.96**
අධිකරණ අංශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	**රු.බි.**	**0.87**
අධිකරණ පියස ඉදිකිරීම	**රු.බි.**	**3.0**
දිවයින පුරා පිහිටි බන්ධනාගාර 34ක මෙහෙයුම් සහ නඩත්තු කටයුතු	**රු.බි.**	**21.1**
මාතර බන්ධනාගාරය කොටවිල වත්ත ප්‍රදේශයට ගෙන යාම	**රු.බි.**	**0.5**
පල්ලෙකැලේ, වටරැක, වාරියපොළ සහ කළුතර බන්ධනාගාර ඉදිකිරීම් කටයුතු අබණ්ඩව සිදු කරගෙන යාම	**රු.බි.**	**1.88**

කාන්තාවන් සහ ළමයින් – අවදානමට ලක්විය හැකි පුද්ගලයන් සඳහා ඉහළ ආරක්ෂාව, සහයෝගය සහ අවස්ථා



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**0.75**	ආයතනික රැකවරණය, භාරකාරත්වය යටතේ පසුවන ළමුන් සහ වීදි ළමුන් සඳහා වන ජීවන ආධාර දීමනා
රු.බි.	**0.1**	ළමා කේන්ද්‍රීය විකල්ප රැකවරණ පද්ධතිය ශක්තිමත් කිරීම
රු.බි.	**0.18**	පවුල පදනම් කරගත් පරිපූර්ණ සංවර්ධනය සහ සහාය
රු.බි.	**2.3**	පළාත් සභා හරහා ළමා නිවාස සඳහා රැකවරණය, ආරක්ෂාව සපයා දීම සහ සේවාවන් පහසු කිරීම

රු.බි. 17.4

සංස්කෘතිය සහ ආගම – උරුමය සුරැකීම සහ වඩාත් සක්‍රීය සංස්කෘතික සහභාගීත්වය

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	0.25	පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ස්මාරක සංරක්ෂණය හා නඩත්තුව
රු.බි.	0.95	ඓතිහාසික ලේඛන රැස් කිරීම, සුරක්ෂිත කිරීම, සංවිධානය කිරීම සහ නඩත්තු කිරීම සඳහා වන ලේඛනාගාර කළමනාකරණ පද්ධතිය
රු.බි.	1.8	ආගමික ස්ථාන සඳහා සූර්ය බලශක්ති පහසුකම් සැලසීම
රු.බි.	0.55	කෞතුකාගාර අධ්‍යාපනය සහ කෞතුකාගාර සේවා
රු.බි.	0.18	ජෝන් ද සිල්වා සමරු රඟහල ප්‍රතිසංස්කරණය කිරීම
රු.බි.	0.11	ජාතික කලා උළෙල සහ සංස්කෘතික ප්‍රවර්ධන කටයුතු
රු.බි.	0.35	ග්‍රාමීය බෞද්ධ විහාරස්ථාන සංවර්ධනය කිරීම
රු.බි.	0.68	දිවයින පුරා සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම
රු.බි.	0.25	ජංගම රාක්ක පද්ධතිය සැකසීම
රු.බි.	0.74	ජන උරුම සංරක්ෂණය කිරීම

රු.බි. 11.7

ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය ශක්තිමත් කිරීම - වඩාත් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සහ පුරවැසියන්ගේ පුළුල් සහභාගීත්වය



ප්‍රධාන ක්‍රියාකාරකම්

පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය තහවුරු කිරීම	රු.බි.	1.5
පළාත් සභා මැතිවරණය පැවැත්වීම	රු.බි.	8.7
ඡන්දදායකයින් ලියාපදිංචි කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන්	රු.බි.	0.29

රු.බි. 3.3

ජනමාධ්‍ය – නවීන විකාශන සහ තොරතුරු සේවාවන් සඳහා වඩාත් ප්‍රශස්ත ප්‍රවේශයක්

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	1.2	ස්වාධීන රූපවාහිනී ජාලය, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙත රජයේ දායකත්වය
රු.බි.	2.0	රූපවාහිනී විකාශය ඩිජිටල්කරණය කිරීම

ජාතික ආරක්ෂාව

ප්‍රාග්ධන වියදම
රු.බි. 51.2

පුනරාවර්තන වියදම
රු.බි. 376.3

2027
රු.බි. 427.6



2027 වර්ෂයේ දී සිදුකිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි. 4.0	ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු
රු.බි. 8.2	ශ්‍රී ලංකා නාවික හමුදාවේ නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු
රු.බි. 22.3	ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු
රු.බි. 2.8	අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු
රු.බි. 79.0	ත්‍රිවිධ හමුදාව සඳහා ආහාර සහ සලාක දීමනාව
රු.බි. 6.5	ත්‍රිවිධ හමුදාව සඳහා නිල ඇඳුම්
රු.බි. 234.0	ත්‍රිවිධ හමුදාව සඳහා වැටුප් සහ වේතන



ශ්‍රී ලංකා නාවික හමුදාව



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව



ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ප්‍රධාන සුබසාධන වැඩසටහන්



රු.බි. 1.55

රණවිරු මාපිය රැකවරණ වැඩසටහන

රු.බි. 0.02



රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම නඟා සිටුවීම

ආර්ථික සේවා සහ ව්‍යවසායකත්වය

ව්‍යවසායකයන් සඳහා සහාය, ව්‍යාපාර ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාව වෙළඳපොළවල් වෙත සම්බන්ධ කිරීම

2027
රු.බි. 162

ප්‍රාග්ධන වියදම
රු.බි. 107.4

පුනරාවර්තන වියදම
රු.බි. 54.57

	එකතුව	ප්‍රාග්ධන	රු.බි. පුනරාවර්තන
කර්මාන්ත	26.54	19.47	7.07
කම්කරු සහ විදේශ රැකියා	8.9	2.2	6.7
තැපැල් සේවා	27.95	1.5	26.4
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය	71.46	67.9	3.5
සංචාරක	12.29	9.9	2.36
රේගු හා වෙළඳ	14.85	4.4	10.42



ව්‍යාපාර ආරම්භ කිරීම සහ වර්ධනය සඳහා ණය යෝජනා ක්‍රම - ව්‍යාපාර ආරම්භ කිරීම, වර්ධනය අබණ්ඩව පවත්වා ගෙනයෑම සඳහා වැඩි අවස්ථාවන්

රු.බි. 71.46

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය

ප්‍රධාන ක්‍රියාකාරකම්



රු.බි.	17.2	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහන - මාස 120ක නැවත ආපසු ගෙවීමේ කාල සීමාවක් සමඟ උපරිමය රු. මිලියන 75ක් දක්වා ආයෝජන සහ ඒකාබද්ධ ණය පහසුකම් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ලබාදීම
රු.බි.	30.0	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය පුනර්ජීවනය කිරීම දිරිමත් කිරීමේ ණය යෝජනා ක්‍රමය - ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මාස 120ක නැවත ආපසු ගෙවීමේ කාල සීමාවක් සමඟ 5%ක පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 25ක උපරිමයක් දක්වා ආයෝජන සහ ඒකාබද්ධ ණය පහසුකම් ලබාදීම - අක්‍රිය ණය කාණ්ඩයේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මාස 60ක නැවත ආපසු ගෙවීමේ කාල සීමාවක් සමඟ 5%ක පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 15ක උපරිමයක් දක්වා ආයෝජන සහ ඒකාබද්ධ ණය ලබාදීම
රු.බි.	5.9	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය - ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මාස 120ක නැවත ආපසු ගෙවීමේ කාල සීමාවක් සමඟ 6%ක පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 50ක උපරිමයක් දක්වා ආයෝජන, කාරක ප්‍රාග්ධන සහ ඒකාබද්ධ ණය පහසුකම් ලබාදීම
රු.බි.	2.9	නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය - වී ඇතුළු බෝග වර්ග 35ක් වගා කිරීමෙහි නියැළෙන ගොවීන් සඳහා 5%ක පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 3.0ක උපරිමයක් දක්වා කාරක ප්‍රාග්ධන ණය ලබාදීම
රු.බි.	0.4	ලියාපදිංචි කාන්තා සංගම්වල සාමාජිකාවන් හට දැනට පවතින ව්‍යාපාරයක් දියුණු කර ගැනීමට හෝ නව ජීවනෝපායක් ආරම්භ කිරීම සඳහා රු. 250,000ක උපරිමයකට යටත්ව ප්‍රදාන ලබා දීම සහ එවැනි පවුල්වල NVQ 3 හෝ ඊට ඉහළ සුදුසුකම් සහිත දරුවන්ට නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා සහාය වීම.
රු.බි.	7.1	කෘෂිකාර්මික අගය දම සංවර්ධනය - තේ, රබර්, කුළුබඩු,පොල්, උද්‍යාන වගා, ජලජීවී වගාව, මත්ස්‍ය සැකසුම්, කිරි නිෂ්පාදන හා සත්ත්ව ආහාර නිෂ්පාදනයේ නියැලෙන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ආයෝජන, කාරක ප්‍රාග්ධන සහ ඒකාබද්ධ ණය ලබාදීම - උපරිම ණය මුදල - රු. මිලියන 75
රු.බි.	1.1	කෘෂිකාර්මික සහ කර්මාන්ත අංශයේ තරුණ ව්‍යවසායකයන් සංවර්ධනය කිරීම - කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්තවල ව්‍යවසායකත්වය සඳහා මාස 60ක නැවත ආපසු ගෙවීමේ කාල සීමාවක් සමඟ 4% ක පොලී අනුපාතිකයක් යටතේ රු. මිලියන 5ක උපරිමයක් දක්වා ණය ලබාදීම
රු.බි.	5.0	2027 වසරේදී 'අස්වැසුම' පවුල් 200,000ක් සවිබල ගැන්වීමේ අරමුණින්, නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ පවතින ව්‍යාපාරයක් දියුණු කර ගැනීම සඳහා රු. 150,000ක් දක්වා උපරිම වටිනාකමකින් යුත් ද්‍රව්‍යමය/සේවාමය ආධාර (in-kind grants) ලබා දීම; 'අස්වැසුම' පවුල්වල සාමාජිකයින් වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීමේදී, එම පාඨමාලා ගාස්තු ලෙස රු. 150,000ක් දක්වා මුදලක් ගෙවීම; සහ 'අස්වැසුම' පවුල් විසින් ව්‍යාපාර කටයුතු සඳහා සමෘද්ධි බැංකු වෙතින් ලබා ගන්නා ණය (රු. 500,000ක උපරිම සීමාවට යටත්ව) සඳහා වන 6%ක පොලී අනුපාතයෙන් 4%ක කොටසක් ගෙවීම
රු.බි.	1.33	අස්වැසුම' පවුල් 10,575ක් සවිබල ගැන්වීම - උපදේශන සේවා සැපයීම, පවුල් සංවර්ධන සැලසුම් සහ ව්‍යාපාර සැලසුම් සකස් කිරීම, ව්‍යාපාර ආශ්‍රිත පුහුණුව ලබා දීම සහ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ පවතින ව්‍යාපාරයක් පුළුල් කිරීම සඳහා රු. 150,000ක උපරිමයකට යටත් ප්‍රදානයක් ලබා දීම
රු.බි.	0.2	ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා NVQ සුදුසුකම් ලත් සිසුන් වෙත ණය පහසුකම් ලබා දීම

ආයෝජන සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම - වැඩි ආයෝජන සහ ශක්තිමත් හා ඵලදායී කර්මාන්ත

රු.බි. 26.54



කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	4.0	වාලච්චේනයි, ඉංගිරිය, දඹුල්ල, රයිගම හා කටුනායක ඇතුළු දැනට පවතින කාර්මික ජනපද 33 ක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම
රු.බි.	4.0	කොළඹ වරාය නගරය වෙත ජල සැපයුම හා අපජලය බැහැර කිරීම වැනි උපයෝගිතා පහසුකම් සැපයීම
රු.බි.	1.0	පර්යේෂණවල ප්‍රතිඵල වාණිජ්‍යකරණය
රු.බි.	1.0	ආයෝජන හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම
රු.බි.	0.8	බිංගිරිය ආයෝජන කලාපය පිහිටුවීම
රු.බි.	2.5	පෙව තාක්ෂණය සහ නැනෝ තාක්ෂණ පර්යේෂණ සඳහා රජයේ දායකත්වය

ශ්‍රම බලකාය - ශ්‍රම බලකා වෙළඳපොළ සඳහා ප්‍රබල සහායක්

රු.බි. 8.9



ප්‍රධාන ක්‍රියාකාරකම්

සේවක අර්ථසාධක අරමුදල ද ඇතුළුව කම්කරු දෙපාර්තමේන්තුවේ දිවයින පුරා ශාඛා ජාලය ඔස්සේ සේවා සැපයීම — රු.බි. 0.43

රු.බි. 12.85

වෙළඳ කටයුතු පහසු කිරීම හා වෙළඳ කටයුතුවල දී දේශසීමා මායිම් ආරක්ෂා කිරීම - වඩාත් පහසු වෙළඳාමක්

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	1.7	ශ්‍රී ලංකා රේගුවේ ASYCUDA පද්ධතිය ප්‍රතිසංස්කරණය සහ නඩත්තු කිරීම
රු.බි.	1.99	ජාත්‍යන්තර වෙළඳාම පහසු කිරීම සඳහා වන තනි ජාතික ඩිජිටල් පද්ධතිය (National Single Window System)
රු.බි.	0.57	රේගු අධීක්ෂණ කටයුතු හා ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සවිමත් කිරීම
රු.බි.	0.2	වී සඳහා වන බීජෝෂණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම
රු.බි.	0.66	පාරිභෝගික කටයුතු සුරැකීම
රු.බි.	0.1	මොණරාගල සහ අනුරාධපුර වී ගබඩා ප්‍රතිසංස්කරණය කිරීම

පුද්ගලයන් සහ ව්‍යාපාර සම්බන්ධ කෙරෙන සේවා ශක්තිමත් කිරීම - අත්‍යවශ්‍ය සන්නිවේදන හා බෙදාහැරීමේ සේවා වෙත මනා ප්‍රවේශයක්

රු.බි. 27.95

ප්‍රධාන ක්‍රියාකාරකම්

දිවයින පුරා තැපැල් ජාලය ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම	රු.බි.	0.5
තැපැල් සේවා මෙහෙයුම් සඳහා වන කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	රු.බි.	23.1

රු.බි. 12.29

සංචාරක කටයුතු හා ප්‍රාදේශීය ආර්ථික කටයුතු වර්ධනය කිරීම - සංචාරක කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම් වැඩිවීම හා ප්‍රාදේශික ව්‍යාපාරයන් සඳහා වැඩි අවස්ථා -

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	0.67	උරුම මංපෙත් වැඩිදියුණු කිරීම - ගෝර්ඩින් උද්‍යානය මහජනතාව වෙත විවෘත කිරීම, ගාලු මුවදෙර පිටිය වැඩිදියුණු කිරීම, ජාතික කොඩිය ඔසවන ස්ථානය, තැපැල් මූලස්ථානය, පැරණි නගර ශාලා ගොඩනැගිල්ල සහ සිංහරාජ ගමනාන්ත ප්‍රතිසංස්කරණය කිරීම
රු.බි.	1.3	උතුරු සහ නැඟෙනහිර පළාත්වල සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
රු.බි.	2.7	සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ නගර සන්නාමකරණය
රු.බි.	3.0	සීගිරියේ සහ ත්‍රිකුණාමලයේ සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
රු.බි.	2.8	සත්ත්ව සහ උද්භිද උද්‍යානවල මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු
රු.බි.	0.36	සංචාරක ගමනාන්ත සංවර්ධනය කිරීම
රු.බි.	0.9	බේරේ වැවේ ජලය පිරිසිදු කිරීම මඟින් වම වැව සහ ඒ අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම



විශ්වාසනීය සහ දැරිය හැකි පිරිවැයකට තිරසාර බලශක්ති සැපයුමක්

ගෘහස්ථ, ව්‍යාපාරික සහ ආර්ථික ක්ෂේත්‍ර සඳහා විදුලිබල පද්ධතිය ශක්තිමත් කිරීම

ප්‍රාග්ධන වියදම
රු.බි. 29.0

පුනරාවර්තන වියදම
රු.බි. 1.2

2027
රු.බි. 30.2



2027 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

විදුලිබල පද්ධතිය සවිමත් කිරීම-
වඩාත් විශ්වසනීය විදුලිබල සැපයුමක් සහ සම්ප්‍රේෂණ බාධා අවම කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**4.9**	ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීම සහ නවීකරණය කිරීම
රු.බි.	**4.2**	කෙරවලපිටිය-කොළඹ වරාය දෙවන සම්ප්‍රේෂණ මාර්ගය
රු.බි.	**3.3**	නව හබරණ-කප්පල්තුරෙ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය
රු.බි.	**3.1**	සාම්පූර්-කප්පල්තුරෙ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති
රු.බි.	**0.5**	උතුරු සම්ප්‍රේෂණ මාර්ගය සංවර්ධනය කිරීම



විදුලිබල පද්ධති ස්ථායීතාව වැඩිදියුණු කිරීම -
වඩාත් ස්ථාවර විදුලිබල පද්ධතියක්

වැඩිදියුණු කළ බෙදාහැරීමේ කළමනාකරණ පද්ධති සහිත බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථාන හතරක් පිහිටුවීම	**රු.බි.**	**5.1**

පුනර්ජනනීය බලශක්තිය පුළුල් කිරීම - වඩාත් පිරිසිදු බලශක්තියක් සහ මිල අධික බලශක්ති ප්‍රභවයන් මත යැපීම අවම කිරීම



ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**1.25**	ඩෙල්ෆ්ට්, අනලතිව් සහ නයිනතිව් දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම
රු.බි.	**1.0**	වහල මත සූර්ය බල පද්ධති ඒකාබද්ධ කිරීමේ සහ අතථ්‍ය ශුද්ධ මිනුම්කරණ (Virtual Net Metering) ව්‍යාපෘතිය
රු.බි.	**1.0**	කොළඹ නගරයේ අපද්‍රව්‍ය බලශක්ති බලාගාරයේ මෙහෙයුම්වල තිරසාරභාවය තහවුරු කිරීම

ව්‍යාපෘති සූදානම ඉහළ නැංවීම සහ බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණ -
ඉහළ ආයෝජන, නවෝත්පාදන සහ සුනිත්‍ය බලශක්ති සංවර්ධනය

ප්‍රධාන ක්‍රියාකාරකම්

ව්‍යාපෘති සැකසුම් සහ සූදානම ඉහළ නැංවීම	**රු.බි.**	**0.3**
බලශක්ති අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය පිහිටුවීම	**රු.බි.**	**0.01**



ජනතා හිතවාදී රාජ්‍ය සේවයක්

වඩාත් පහසු ප්‍රවේශයකින් යුතු කාර්යක්ෂම හා ප්‍රතිචාරාත්මක රජයේ සේවා බිහිකිරීම

2027
රු.බි. 371.8

ප්‍රාග්ධන වියදම
රු.බි. 163.17

පුනරාවර්තන වියදම
රු.බි. 238.69

	එකතුව	ප්‍රාග්ධන	රු.බි. පුනරාවර්තන
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් සභා හරහා මහජන සේවා සැලසීම	174.6	44.8	129.8
විධායකය සහ ව්‍යවස්ථාදායකය	19.88	3.4	16.48
මූල්‍ය කටයුතු	127.9	94.1	33.88
විදේශ කටයුතු	22.36	1.76	20.6
රජයේ මුද්‍රණ සහ ප්‍රකාශන කටයුතු	7.34	2.76	4.58
රජයේ සේවා ඩිජිටල්කරණය	19.53	16.1	3.39



2027 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි. 174.6

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් සභා මඟින් සැලසෙන මහජන සේවා තුළින් රජයේ සේවාවන් ජනතාවට වඩාත් සමීප කිරීම

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**42.16**	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 341ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක් මඟින් සේවා සැලසීම වෙනුවෙන් වැටුප් හා වේතන ගෙවීම්
රු.බි.	**7.2**	ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම
රු.බි.	**1.75**	යටිතල පහසුකම් සංවර්ධනය සහ ආදායම් උත්පාදනය සඳහා පළාත් පාලන ආයතන වෙත මූල්‍ය සහාය
රු.බි.	**2.5**	වවුනියාව, පුත්තලම, අනුරාධපුරය, දෙහිඅත්තකණ්ඩිය, ඇලපාත, පිටබැද්දර, හෝමාගම, මීගමුව සහ මාලිම්බඩ ඇතුළු ප්‍රදේශවල දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඉදිකිරීම සහ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම
රු.බි..	**1.0**	ආදායම් ඉහළ නැංවීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත සහාය වීම
රු.බි.	**27.6**	පළාත් සභා මඟින් සිදු කරනු ලබන නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු (මාර්ග, වාරිමාර්ග, අධ්‍යාපන සහ සෞඛ්‍ය ක්ෂේත්‍ර හැර)
රු.බි.	**0.23**	පළාත් පාලන ආයතනවල බදු පරිපාලනය සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම
රු.බි.	**0.3**	පළාත් පාලන ආයතනවල මහජන පහසුකම් මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම.

රු.බි. 19.5

රජයේ සේවා ඩිජිටල්කරණය - වඩාත් කඩිනම් සහ පහසු මහජන සේවාවන්

ප්‍රධාන ක්‍රියාකාරකම්



රජයේ ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය	**රු.බි.**	**9.48**
රජයේ ඩිජිටල්කරණ ක්‍රියාවලියට අදාළව ආයතන ශක්තිමත් කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ නියාමන කටයුතු	**රු.බි.**	**1.4**
රජයේ සේවාවන්හි සයිබර් ආරක්ෂාව ඉහළ නැංවීම	**රු.බි.**	**0.61**
ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඩිජිටල්කරණය	**රු.බි.**	**0.97**

රු.බි. 127.9

මහජන මුදල් වඩාත් ඵලදායී ලෙස භාවිත කිරීම - ශක්තිමත් මූල්‍ය කළමනාකරණයක්

ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි.	**3.2**	මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය
රු.බි.	**1.2**	කෘෂිකාර්මික නොවන කටයුතු පිළිබඳ ආර්ථික සංගණනය
රු.බි.	**5.6**	ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම
රු.බි.	**1.3**	නිෂ්පාදනය තහවුරු කිරීම සඳහා මධ්‍යසාර බෝතල් මත ස්ටිකර් ඇලවීම
රු.බි.	**0.5**	රාජ්‍ය ආයතන තුළ විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය පුළුල් කිරීම
රු.බි.	**0.5**	ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය

රු.බි. 35

සේවාවන් කාර්යක්ෂමව සැලසීම සඳහා රජයේ ආයතනවලට වාහන ලබා දීම

යහපාලනය ශක්තිමත් කිරීම - මනා සම්බන්ධීකරණය, වගවීම හා රාජ්‍ය අංශයේ කළමනාකරණය

රු.බි. 19.9

ප්‍රධාන ක්‍රියාකාරකම්

දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කිරීම	රු.බි.	2.5
ජාතික විගණන පනත ක්‍රියාත්මක කිරීම	රු.බි.	4.8


රු.බි. 22.36

ජාත්‍යන්තර සම්බන්ධතා -ශ්‍රී ලංකාවේ අභිලාෂයන් වෙනුවෙන් ශක්තිමත් ජාත්‍යන්තර මැදිහත්වීමක් සහ සහාය ලබා ගැනීම


ප්‍රධාන ක්‍රියාකාරකම්

විදේශ දූත මණ්ඩල සහ ඒ ආශ්‍රිත කටයුතු රු.බි. 18.9

රාජ්‍ය අංශයේ වැටුප් සහ විශ්‍රාම වැටුප්



රාජ්‍ය අංශයේ වැටුප්



වෘත්තිය අනුව රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය	
ගුරු සේවය	225,314
සංවර්ධන නිලධාරීන්	100,179
පොලිස් නිලධාරීන්	81,083
හෙද නිලධාරීන්	42,436
කළමනාකරණ සේවා නිලධාරීන්	40,159
වෛද්‍යවරුන්	25,915
සිවිල් ආරක්ෂකයින්	23,675
කාර්යාල සේවක සේවය	20,143
තැපැල් සේවය	19,327
සමෘද්ධි සංවර්ධන නිලධාරීන්	16,051
දුම්රිය සේවය	12,757
ග්‍රාම නිලධාරීන්	11,815
විදුහල්පතිවරුන් (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය / ශ්‍රී ලංකා විදුහල්පති සේවය)	11,772
ශ්‍රී ලංකා තාක්ෂණික සේවය	9,635
පවුල් සෞඛ්‍ය සේවිකාවන්	8,900
රියදුරු සේවය	8,139
කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්	5,919
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	4,955
ආයුර්වේද වෛද්‍යවරුන්	2,353
ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්	2,315
මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්	2,248
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය	1,775
ශ්‍රී ලංකා රේගු සේවය	1,647
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්	1,634
ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්	1,611
ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්	1,138
සුරාබදු සේවය	1,010
ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවය	982
ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය	802
ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නිලධාරීන්	759
ශ්‍රී ලංකා මිනින්දෝරුවන්	741
ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා නිලධාරීන්	670
ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	448
ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්	55
වෙනත්	205,435

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

සියල්ලන්ම ආවරණය වන සමාජ ආරක්ෂණ පද්ධතියක්

අමතර සහාය අවශ්‍ය වන පවුල්, වැඩිහිටි පුද්ගලයින් සහ ජනතාව සවි බලගැන්වීම

ප්‍රාග්ධන වියදම
රු.බි. 5.4

පුනරාවර්තන වියදම
රු.බි. 907.1

2027
රු.බි. 912.5







2027 සඳහා සැලසුම් කර ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්

රු.බි. 230.0

අස්වැසුම වැඩසටහන



අඩු ආදායම්ලාභී පවුල් සඳහා මුදල් ප්‍රදාන	රු.බි. 142.9
අඩු ආදායම්ලාභී ආබාධිත තැනැත්තන් සඳහා සහාය	රු.බි. 22.1
වැඩිහිටියන් (වයස අවුරුදු 70ට වැඩි) සඳහා මූල්‍ය සහාය	රු.බි. 58.7
වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය සහාය	රු.බි. 6.6

රු.බි. 630.0

විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික



රාජ්‍ය නිලධාරීන් සඳහා විශ්‍රාම වැටුප් (විශ්‍රාමිකයින් 730,000)	රු.බි. 425.0
රාජ්‍ය නිලධාරීන්ගේ වැන්දඹු, වැන්දඹු පුරුෂ සහ අනත් දරු විශ්‍රාම වැටුප්	රු.බි. 82.0
පාරිතෝෂික දීමනා ගෙවීම්	රු.බි. 63.0
මියගිය සහ තුවාල ලැබූ රණවිරුවන් සඳහා වන සේවා වන්දි	රු.බි. 60.0

රු.බි. 2.96

අනෙකුත් සුබසාධන කටයුතු



ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ බැංකු ගිණුම් සඳහා පොලී අනුපාත වෙනස	රු.බි. 1.0
විශ්‍රාමිකයින් සඳහා දුම්රිය බලපත්‍ර	රු.බි. 0.96
විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා අවශ්‍ය පහසුකම් සහිත දිවා සුරැකුම් මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම	රු.බි. 1.0





පොදු විෂයයන්

වත්කම් නඩත්තු කිරීම හා පුනරුත්ථාපනය



2027
රු.බි. 241

වත්කම්වල පවතින තත්ත්වය ආරක්ෂා කර ගැනීමට සහ ඒවායේ ක්ෂය වීමේ වේගය අඩු කිරීමට සිදු කරනු ලබන ක්‍රියාමාර්ග නඩත්තුව' (maintenance) ලෙස වර්ගීකරණය කෙරේ. වත්කමක සැලකිය යුතු ගෙවී යාමක්, ව්‍යුහාත්මක දිරාපත් වීමක් හෝ ක්‍රියාකාරිත්වයේ පිරිහීමක් සිදුවී ඇති අවස්ථාවක, එය නැවත යථා තත්ත්වයට පත් කිරීම (restoration) සහ වැඩිදියුණු කිරීම (upgrading) සඳහා සිදු කරනු ලබන ක්‍රියාකාරකම් ප්‍රතිසංස්කරණය' (rehabilitation) ලෙස සැලකේ. 2027 වසරේදී, නඩත්තු කටයුතු සඳහා රුපියල් බිලියන 50 ක මුදලක් වෙන් කර ඇති අතර, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රුපියල් බිලියන 191 ක මුදලක් වෙන් කර ඇත. මෙම වර්ගීකරණයට අයත් ප්‍රධාන අංශ පහත දැක්වේ.

අංශය	පුනරුත්ථාපනය හා නඩත්තුව සඳහා වෙන් කළ ප්‍රතිපාදන (රු.බි.)
මාර්ග	40.6
ප්‍රවාහනය (දුම්රිය සේවා)	19.5
වාරිමාර්ග	22.9
සෞඛ්‍යය	36.0
අධ්‍යාපනය	28.0
ආරක්ෂක කටයුතු	34.8

පර්යේෂණ සහ සංවර්ධනය

2027
රු.බි. 24



රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධන වියදම් යන්නෙන් අදහස් වන්නේ විද්‍යාත්මක පර්යේෂණ, තාක්ෂණික නවෝත්පාදන සහ නව නිෂ්පාදන, ක්‍රියාවලි සහ සේවා සංවර්ධනය කිරීම සඳහා රජය සහ රාජ්‍ය ආයතන විසින් වැය කරන මුදලයි. ශ්‍රී ලංකාව දැනුම පදනම් කර ගත්, නවෝත්පාදනයෙන් මෙහෙයවනු ලබන රටක් බවට පරිවර්තනය කිරීමට අපේක්ෂා කරන මෙම පසුබිම තුළ, පර්යේෂණ සහ සංවර්ධන (R&D) සඳහා වන රාජ්‍ය වියදම් ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ පාරිසරික ප්‍රගතිය සඳහා ඉතා වැදගත් වේ. ඉහත කාර්යයන් සඳහා 2027 වසර සඳහා වන වෙන් කිරීම **රුපියල් බිලියන 24** කි. මෙම මුදලින් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් කෘෂිකාර්මික අංශයට අදාළ පර්යේෂණ කටයුතු සඳහා වැය කෙරේ.



ඩිජිටල් පරිවර්තනය

2027
රු.බි. 40

ඩිජිටල් පරිවර්තනය යනු තවදුරටත් හුදෙක් තාක්ෂණික මුලපිරීමක් පමණක් නොව, රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, යහපාලනය ශක්තිමත් කිරීම, ආර්ථික වර්ධනයට පහසුකම් සැලසීම සහ සියලුම පුරවැසියන්ට රාජ්‍ය සේවාවන් ලබා ගැනීමේ පහසුකම් තහවුරු කිරීම සඳහා වන මූලික අවශ්‍යතාවකි. රාජ්‍ය පරිපාලනය නූතනකරණය කිරීම, රජයේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වර්ධනය කිරීම සහ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා වන ප්‍රධාන මෙවලමක් ලෙස ඩිජිටල්කරණය හඳුනා ගෙන ඇත.

මේ සම්බන්ධයෙන් වැදගත් මූලපිරීම් කිහිපයක් දැනටමත් ආරම්භ කර ඇති අතර, රාජ්‍ය ආයතන සාර්ථක ලෙස පරිවර්තනය කිරීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම්, ආයතනික ශක්තිමත් කිරීම්, ආරක්ෂිත තොරතුරු පද්ධති, නියාමන රාමු මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ කුසලතා සහ හැකියාවන් වෙනුවෙන් තිරසාර ආයෝජනයක් අවශ්‍ය වේ.

එබැවින්, මෙවර අයවැය තුළ ඉහත අරමුණ ළඟාකර ගැනීමට සියලු ආයතන මඟින් රු.බි. 40 කට වැඩි වියදමක් දැරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, හඳුනා ගත් තේමා 6ක් යටතේ එනම් ආයතනික ශක්තිමත් කිරීම, ප්‍රතිපත්ති සහ නියාමනය, ඩිජිටල් රාජ්‍ය පරිවර්තනය, ඩිජිටල් කර්මාන්ත සංවර්ධනය සහ වර්ධනය, ඩිජිටල් ආදායම් ආර්ථිකය සක්‍රීය කිරීමේ මූලපිරීම, උපායමාර්ගික කර්මාන්ත ඩිජිටල්කරණය කිරීමේ මූලපිරීම සහ සහභාගීත්ව ප්‍රවේශය, භාවිතය හා ධාරිතා වර්ධනය යටතේ රටේ ඩිජිටල් පරිවර්තනයට සහ ඩිජිටල් ආර්ථිකයේ සංවර්ධනයට සහාය වීම සඳහා 2027 වසර වෙනුවෙන් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය වෙත රුපියල් බිලියන 18.5 ක් වෙන් කර ඇත.

සුදුසු නීතිමය යටිතල පහසුකම් ස්ථාපිත කිරීම මඟින් ඩිජිටල් සේවා සැපයීමේ ආරක්ෂිත පැතිකඩ සහ අතථ්‍ය (virtual) ඩිජිටල් වත්කම් භාවිතය තහවුරු කරන අතර ම, පුරවැසියන් සඳහා ඩිජිටල් සේවාවන් වෙත ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීම වෙනුවෙන් රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කිරීම වේගවත් කිරීම මෙහි ප්‍රධාන අවධානයයි. ජාල සබඳතා වෙත පුරවැසියන්ගේ ප්‍රවේශය වැඩිදියුණු කිරීමට සහ සුදුසු කෘතිම බුද්ධි (AI) යටිතල පහසුකම් ස්ථාපිත කරමින් කෘතිම බුද්ධිය පිළිබඳ විශේෂ අවධානයක් සහිතව රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ ධාරිතාව වර්ධනය කිරීමට විවිධ වැඩසටහන් සකස් කර ඇත.

